තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය
இளைஞர் மற்றும் விளையாட்டுத்துறை அமைச்சு
Ministry of Youth and Sports

නො.09 , පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07. இல. 09. பிலிப் குணவர்த்தன மாவத்தை. கொழும்பு 07. No.09, Philip Gunawardana Mawatha, Colombo 07.


මගේ අංකය / எனது இல / My No. } MOYS/YAD/09/08

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date. } 2021.03. 26

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව 23 APR 2021

ලේකම් කාර්යාලය 08 APR 2021

එච්. කේ. ඩී. ඩබ්. එම්. එන්. බී. හපුතින්න මහතා
ලේකම්
සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා
ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

හිතවත් ලේකම්තුමනි,

<u>**දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යවසාය සතිපොළ වැඩසටහන**</u>

රට හදන **"සෞභාග්‍යයේ දැක්ම"** ප්‍රතිපත්ති ප්‍රකාශයට සහ ගෘහාශ්‍රිත කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන ජනාධිපති කාර්යසාධන බලකායේ වැඩසටහනට අනුගත වෙමින්, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය මගින් දිවයිනපුරා විසිරී සිටින තරුණ ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන අලෙවි කිරීමේ ගැටළුවට ප්‍රාදේශීය මට්ටමෙන් විසඳුම් සෙවීම අරමුණු කරගෙන දිවයිනපුරා විශේෂ සතිපොළ **100** ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

02. ජාතික ආර්ථිකයේ කොඳුනාරටිය ලෙස හඳුනාගෙන ඇති සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදන ක්ෂේත්‍රයේ නියැලෙන තරුණ ව්‍යවසායකයින් ග්‍රාමීය මට්ටමේ සිට ජාතික තලය දක්වා ඔසවා තැබීම සඳහා අවශ්‍ය දිරිගැන්වීම සිදුකිරීම යෝජිත සතිපොළ වැඩසටහනේ ප්‍රමුඛතම අරමුණ වේ. මෙම ව්‍යවසාය සතිපොළ දිවයින පුරා දැනට සතිපොළ පවත්වාගෙන යනු ලබන පරිශ්‍රයන්හි සතිපොළ නොපවත්වන දින යොදාගෙන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

03. තරුණ හා ක්‍රීඩා අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාගේ උපදෙස් හා සෘජු මඟපෙන්වීම යටතේ උක්ත වැඩසටහන දිවයින පුරා මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මඟින්, ක්‍රියාත්මක කරනු ලැබේ.

04. යෝජිත සතිපොළ තුළ ඔබ අමාත්‍යාංශය යටතේ ගොඩනැගුණු හා එම පොළ ආසන්න ප්‍රදේශයේ පදිංචි ව්‍යවසායකයින්ට/ ස්වයංරැකියාලාභින්ට සිය භාණ්ඩ අලෙවි කර ගැනීමට අවස්ථාවක් සළසා දීමට හැකියාව පවතී.

05. ඒ අනුව, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමෘද්ධි නිලධාරීන් මඟින් මෙම ව්‍යවසාය සතිපොළ වැඩසටහන පිලිබඳව දැනුවත් කර, ඒ සඳහා සමෘද්ධි ව්‍යාපාරය යටතේ ගොඩනැගුණු ව්‍යවසායකයින්/ ස්වයංරැකියාලාභීන් සම්බන්ධ කිරීමට හා එහි සාර්ථකත්වය සඳහා සුදුසු පරිදි අනුග්‍රාහකත්වය ලබාදීමට ඔබගේ මැදිහත්වීම කාරුණිකව අපේක්ෂා කරමි.

06. මෙ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කරමි.

මෙයට - හිතවත්,

අනුරාධ විජේකෝන්
ලේකම්

පිටපත්:

1. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය - අ.ක.ස.
2. අධ්‍යක්ෂ, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය - අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය සඳහා.


දුරකථනය / தொலைபேசி / Telephone } 011-2697934
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2688836
ඉ-තැපැල / மின்னஞ்சல் / E-mail } secretary@mos.gov.lk
වෙබ් / இணையத்தளம் / Web } www.mos.gov.lk